# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 10 දරන
# ලංකා බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1974 අප්‍රේල් මස      වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත    තැපැල් ගාස්තුව : ශත

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන
# ලංකා බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 23/72.

**ලංකා බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන ලංකා බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකු ආඥාපනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— (397 වන අධිකාරයේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

"මධ්‍යම කාර්යාලය.

4. බැංකුවේ මධ්‍යම කාර්යාලය ශ්‍රී ලංකාවේ කොළඹ නගරයෙහි තිබිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— (ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

"බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය.

6. (1) බැංකුවේ ව්‍යාපාරය හා කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය හා පරිපාලනය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් හය දෙනකුගෙන් සමන්විත වන මණ්ඩලයක් වෙත පැවරෙන්නේය. එම අධ්‍යක්ෂවරුන් අතුරෙන් (මෙහි මින්මතු "නිලබලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් විෂය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා භාරයේ ඇති අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන්නේය.

(2) මණ්ඩලය විසින් බැංකුවේ ව්‍යාපාරය කර ගෙන යාමේ හා කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා බැංකුවේ බලතල, කාර්යයන් හෝ යුතුකම් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

(3) අධ්‍යක්ෂවරුන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ දෝෂයක් තිබීමේ හෝ නිලබලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ බලය පැවරීමේ දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් පමණක් ම මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවන්නේය.

(4) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයෙක් අධ්‍යක්ෂ

(5) පත් කළ අධ්‍යක්‍ෂවරුන්ගෙන් එක් කෙනකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කළ යුතුය.

(6) සෑම පත් කළ අධ්‍යක්‍ෂවරයකු ම, ඔහු කලින් ධූරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ තම ධූරය අත්හැරිය හොත් මිස අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතුය.

(7) පත් කළ අධ්‍යක්‍ෂවරයකු අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ සිය ධූරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් ව සිටින හොත් අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකිය.

(8) නිලබලයෙන් පත් වූ අධ්‍යක්‍ෂවරයා මණ්ඩලයේ රැස්වීමකට පැමිණීමට අපොහොසත් වුව හොත් එකී රැස්වීමේදී තමා වෙනුවෙන් පෙනී සිටීමට වෙන යම් නිලධරයකුට එකී අධ්‍යක්‍ෂවරයා විසින් බලය පැවරිය හැකිය. තවද එසේ බලය පවරනු ලැබූ නිලධරයා එකී රැස්වීමේ කාර්යය සඳහා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සලකනු ලැබේ.

(9) පත් කළ අධ්‍යක්‍ෂවරයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක මාර්ගයෙන් තම ධූරයෙන් ඉල්ලා අස් විය හැකිය.

(10) අමාත්‍යවරයා විසින්, අවශ්‍යාවෝචිත යයි ඔහු සලකන්නේ නම්, පත් කළ අධ්‍යක්‍ෂවරයකු ධූරයෙන් ඉවත් කළ හැකිය.

(11) ඉල්ලා අස්වීමෙන් හෝ කාලය ගෙවී යාමෙන් ධූරය අත් හැර යන අධ්‍යක්‍ෂවරයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

(12) නිල බලයෙන් පත් වූ අධ්‍යක්‍ෂවරයාට පත් කළ අධ්‍යක්‍ෂවරුන්ට ඇති සියලු ම අයිතිවාසිකම් හා වරප්‍රසාද ඇත්තේය.

(13) මේ වගන්තියේ (1), (2) හා (3) යන උප වගන්තිවල විධිවිධාන 1961 ඔක්තෝබර් මස 12 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතුය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාග්ධනය. 7. (1) බැංකුවේ ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් දහස බැගින් වූ කොටස් එක් ලක්ෂ විසි දහසකට බෙදන ලද රුපියල් දොළොස් කෝටියක් වන්නේය.

(2) ඇනට ආණ්ඩුව දරන කොටස් වන එක් කොටසක් රුපියල් පනහ බැගින් වූ පරිවර්ත්‍ය වරණීය කොටස් තිස්දහස හා එක් කොටසක් රුපියල් පනහ බැගින් වූ සාමාන්‍ය කොටස් හැට දහස, එක් එක් කොටස රුපියල් එක්දහස බැගින් වූ කොටස් අනූදහසකට පරිවර්තනය කරනු ලැබේ ; ඉහත කී පරිවර්ත්‍ය වරණීය කොටස්වල හා සාමාන්‍ය කොටස්වල එක් එක් කොටස වෙනුවෙන් අය විය යුතු රුපියල් නවසිය පනහ බැගින් වූ ඉතිරි මුදල වන රුපියල් අටකෝටි පනස් පන්ලක්ෂය ආණ්ඩුවේ සංචිත වගකීම වන්නේය.

(3) එක ම කොටස්කරු වශයෙන් ඕනෑම අවස්ථාවක ආණ්ඩුවේ වගකීම ආණ්ඩුව විසින් තත් කාලයෙහි දරනු ලබන කොටස්වලින් සමන්විත වන සම්පූර්ණ ප්‍රාග්ධන මුදලට සීමා වන්නේය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ස්ථිර සංචිත අරමුදල. 8. (1) මණ්ඩලය විසින්, ලාභාංශ ගෙවීම සඳහා ඇති ලාභවලින්, ලාභාංශයක් ප්‍රකාශ කරනු ලැබීමට පෙර, බැංකුවේ ස්ථිර සංචිත අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක බැරට, එකී ලාභවලින් සියයට විස්සකට සමාන මුදලක් තත් කාලයෙහි බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් එක් අඩකට එකී ස්ථිර සංචිත අරමුදල සමාන වන තුරු වෙන් කොට තැබිය යුතුය ; තව ද ඉක්බිති එකී ස්ථිර සංචිත අරමුදල තත් කාලයෙහි බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් අඩකට අඩු වුවහොත් මණ්ඩලය විසින්, තත් කාලයෙහි බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් එක් අඩකට ඒ ස්ථිර සංචිත අරමුදල සමාන වන තුරු ලාභාංශ ගෙවීම සඳහා ඇති ලාභවලින් අවශ්‍ය විය හැකි අතිරේක මුදලක් හෝ මුදල් හැකි ඉක්මණින් ඒ අරමුදලට ගෙන යා යුතුය. එකී ස්ථිර සංචිත අරමුදලට මේ වගන්තියේ කලින් වූ විධිවිධාන අනුව ගෙන යාමට නියමිත මුදල්වලට අතිරේක ව මණ්ඩලය විසින් යෝග්‍යයයි සලකන

යම් අතිරේක මුදල් එකී ලාභවලින් ඒ අරමුදලට මණ්ඩලයේ අභිමතය පරිදි කලින් කල ගෙන යා හැකිය.

(2) ස්ථිර සංචිත අරමුදල බැංකුවේ ශේෂ පත්‍රයෙහි වෙන් වශයෙන් පෙන්නුම් කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

"අනිශ්චිත අවස්ථා අරමුදල.

9. (1) මණ්ඩලය විසින්, ස්ථිර සංචිත අරමුදලට අතිරේක ව බැංකුවේ අනිශ්චිත අවස්ථා අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ඇති කළ යුතු අතර බැංකුවේ ලාභවලින් උචිත යයි මණ්ඩලය අදහස් කරන යම් මුදලක් ඒ අරමුදලට ගෙන යා යුතුය.

(2) මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු යම් ආකාරයකට—

(අ) ක්ෂයවීම් හා පාඩු පියවීම සඳහා;

(ආ) ලාභාංශ සම තත්ත්වයකට ගෙන ඒම සඳහා;

(ඇ) බැංකුවේ දේපල තිබිමත් අලුත්වැඩියා කිරීම, වැඩිදියුණු කිරීම හෝ නවත්තු කිරීම සඳහා;

(ඈ) මණ්ඩලය උචිත යයි අදහස් කරන වෙන යම් කාර්යයන් සඳහා

අනිශ්චිත අවස්ථා අරමුදල කලින් කල යොදාගනු ලැබිය හැකිය.

(3) මණ්ඩලය විසින්, අනිශ්චිත අවස්ථා අරමුදල, සුදුසු යයි මණ්ඩලය අදහස් කරන විශේෂ අරමුදල්වලට බෙදිය හැකිය. එකී අනිශ්චිත අවස්ථා අරමුදල විශේෂ අරමුදල්වලට බෙදා තිබුණේ නම් ඒ විශේෂ අරමුදල් හෝ ඒ විශේෂ අරමුදල්වල යම් කොටස් හෝ ඒකාබද්ධ කළ හැකිය. අනිශ්චිත අවස්ථා අරමුදලට අයත් වත්කම් බැංකුවේ සෙසු වත්කම්වලින් වෙන් ව තැබීම සඳහා කිසිදු බැඳීමකට යටත් නොවී, එකී අනිශ්චිත අවස්ථා අරමුදල සමන්විත වන වත්කම් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් බැංකුවේ ව්‍යාපාරය සම්බන්ධයෙන් යෙදීමේ පූර්ණ බලය මණ්ඩලයට ඇත්තේ ය. (මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව) බෙදීම ඥනාන්විත නොවේ යයි මණ්ඩලය අදහස් කරන යම් ලාභ, සංචිත අරමුදලට නොතබා ඉදිරියට ගෙන යාමද මණ්ඩලය විසින් කළ හැකිය.

(4) අනිශ්චිත අවස්ථා අරමුදල බැංකුවේ ශේෂ පත්‍රයෙහි වෙන් වශයෙන් පෙන්නුම් කිරීම අවශ්‍ය නොවන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

“ආණ්ඩුවේ සහතිකය.

10. (1) මෙහි පළමුවන උපලේඛනයේ II වන කොටසේ 3(අ) වන වගන්තිය යටතේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතිය ඇති ව බැංකුව විසින් ප්‍රදානය කරන ලද යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් බැංකුවට අයවිය යුතු යම් මුදලක් ආපසු ගෙවීම එකී අමාත්‍යවරයා විසින් සහතික කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහතිකවීමක් ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයක්, ජාතික රාජ්‍ය සභාවේ අනුමතිය ඇතිව, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකයක් දුන් වහාම ඒ සහතිකය පිළිබඳ ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) (1) වන උපවගන්තිය යටතේ සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර දෙන ලද සහතිකවීමක් ඉටු කිරීමෙහි ලා යම් මුදලක් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ගෙවනු ලැබූ බවට ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නොපමාව ම ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

“අධ්‍යක්ෂවරයකු විසින් සම්බන්ධතා එළිදරව් කිරීම.

11. බැංකුව විසින් කරගෙන යනු ලබන හෝ කරගෙන යාමට යෝජිත යම් ව්‍යාපාරයක් පිළිබඳ සම්බන්ධතාවක් යම් අධ්‍යක්ෂවරයකුට හෝ එකී අධ්‍යක්ෂවරයාගේ කලත්‍රයාට හෝ යැපෙන දරුවකුට හෝ තිබේනම් නැතහොත් එකී අධ්‍යක්ෂවරයාගේ, ඔහුගේ කලත්‍රයාගේ හෝ යැපෙන දරුවාගේ සැලෙකිය ප්‍රමාණයක සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරික ආයතනයකට හෝ සමාගමකට එවැනි සම්බන්ධතාවක් තිබේනම් එකී ව්‍යාපාරය සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන මණ්ඩලයේ

අධ්‍යක්ෂවරයා විසින් එළිදරව් කළ යුතුය. ඒ එළිදරව් කිරීම වාර්තා පොතෙහි සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සලකා බැලීමක දී හෝ ගනු ලබන යම් තීරණයක දී ඒ අධ්‍යක්ෂවරයා සහභාගී නොවිය යුතුවත් හැර ඒ සලකා බැලීම කෙරෙන අවස්ථාවේදී හෝ තීරණය කරනු ලබන අවස්ථාවේදී ඔහු ඒ රැස්වීමෙන් ඉවත් විය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"අධ්‍යක්ෂවරයා විසින්, වෙනත් බැංකුවලට හා ණය දෙන ආයතනවලට ඇති යම බැඳීමක් එළිදරව් කළ යුතු බව.

12. වෙනයම් බැංකුවක් හෝ ණය දෙන ආයතනයක් සමග බැඳීමක් ඇතිකර ගන්නා හෝ ඒ බැංකුවෙන් හෝ ආයතනයෙන් ණයක් ලබා ගන්නා තත් කාලයෙහි බැංකුවේ සිටින අධ්‍යක්ෂවරයකු විසින් එකී බැඳීම ඇතිකරගත් හෝ ණය ලබාගත් දිනයෙහි සිට එක් මසක් ඇතුළතදී, එකී බැඳීම හෝ ණය සම්බන්ධ විස්තර බැංකුවට එළිදරව් කළ යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"ණය සඳහා වූ ඉල්ලීම යනාදිය සහ ඒවා පිළිබඳ ව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

13. (1) යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම සාමාන්‍යාධිකාරිවරයා වෙත හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් නම්කරනු ලැබූ නිලධරයකු වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය වන (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ සෑම ඉල්ලීමක් ම, එකී ඉල්ලීම පිළිබඳව සාමාන්‍යාධිකාරිවරයාගේ ලිඛිත නිර්දේශණ සමඟ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය නොවන (1) වන උපවගන්තිය යටතේ සෑම ඉල්ලීමක් ම සම්බන්ධයෙන්, සාමාන්‍යාධිකාරිවරයා හෝ ඒ වෙනත් නිලධරයා විසින්, තමා වෙත මණ්ඩලය විසින් පවරන ලද බලතල යටතේ ක්‍රියා කළ ආකාරය, මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

'තැන්පතුවක් හෝ ඉතිරිකිරීමේ ගිණුමක් ඇති තැනැත්තන් විසින් නාමනය කිරීම.

**14.** (1) තැන්පතුවක් හෝ ඉතිරිකිරීමේ ගිණුමක් ඇති වයස අවුරුදු දහඅටට වැඩි (මෙහි මින් මතු "නාමක" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තකු විසින් තම මරණයෙන් පසු තමාගේ බැරට බැංකුවේ ඇති මුදල් ගෙවනු ලැබිය යුතු (මෙහි මින් මතු "නාමිත" යනුවෙන් හඳුන්වනු ලබන) තැනැත්තකු නාමනය කළ හැකි අතර ගිණුම පවතිද්දී පළමු සඳහන් තැනැත්තාගේ මරණය සිදු වුව හොත් මේ ආඥාපනතේ විධිවිධාන වලට යටත් ව මුදල් එසේ ගෙවනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නාමනයක්, නාමකගේ අන්තිම කැමති පත්‍රයෙහි පටහැනි ව කුමක් සඳහන් වුවද, ඔහුගේ මරණයෙන් පසු ක්‍රියාත්මක වන්නේය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නාමනයක්, නාමකගේ ජීවිත කාලය තුළදී නාමිත මිය යාමෙන් හෝ (නාමකගේ අත්සන සහතික කළ යුතු) සාක්ෂිකරුවකු ඉදිරිපිටදී නාමක විසින් අත්සන් කරන ලද ලිඛිත ප්‍රත්‍යාදිෂ්ට දැන්වීමක් මගින් හෝ නාමක විසින් පසුව කරනු ලබන යම් නාමනයක් මගින් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

(4) (1) වන උපවගන්තිය යටතේ නාමනයක් කළ තැනැත්තාගේ බැරට තම තැන්පතුවල හෝ ඉතිරිකිරීමේ ගිණුමෙහි හෝ ඇති මුදල්, ඔහු මිය ගිය විට, 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ ප්‍රොබේට් බලපත්‍රවලට හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රවල්ට අදාළ නිති කෘත්‍ය පිළිබඳ කාර්ය සඳහා ඒ තැනැත්තාගේ බූදලයේ හෝ දේපලෙහි කොටසක් ලෙස සලකනු නොලබන අතර එකී දේපල පැවරීම ඒ පනතේ 279 වන වගන්තිය යටතේ වරදක් නොවන්නේය.

(5) ඉතිරි කිරීමේ ගිණුමක් ඇත්තාවූද (1) වන උපවගන්තිය යටතේ නාමනයක් කර ඇත්තාවූ ද යම් තැනැත්තකු මිය ගිය පසු බැංකුව විසින්, එකී තැනැත්තාගේ නම සහ ලිපිනය ද ඔහු මිය ගිය බව ද නාමිතගේ නම සහ ලිපිනය ද නාමක මිය යන විට ඔහුගේ බැරට තිබූ මුදල් ප්‍රමාණය ද දන්වමින් සහ ඒ මුදල් වෙනුවෙන් බූදල් බදු ගෙවීම සඳහා යම් මුදලක් අත්හිටුවා ගත යුතු ද යන්න සහ එසේ නම් එකී මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න විමසමින් දේශීය ආදායම් කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැල් මගින් ලියවිල්ලක් යැවිය යුතුය.

(6) නොගෙවා අත්හිටුවා ගත යුතු මුදල් ප්‍රමාණය මෙතෙකැයි (5) වන උපවගන්තිය යටතේ යවන ලද ලියවිල්ලට පිළිතුරු වශයෙන් දේශීය ආදායම් කොමසාරිස් විසින් බැංකුවට දැනුම් දෙනු ලැබුව හොත් බැංකුව විසින් ඒ මුදල් ප්‍රමාණය අත්හිටුවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ඒ මුදල් ප්‍රමාණය ගෙවිය යුතුය.

(7) (5) වන උපවගන්තිය යටතේ යවන ලද ලියවිල්ලට පිළිතුරු වශයෙන් කවර මුදල් ප්‍රමාණයක් නොගෙවා අත්හිටුවා ගත යුතු දැයි නිශ්චය වශයෙන් සඳහන් පිළිතුරක් ඒ ලිපිය තැපැල් කළ හෝ භාර දෙනු ලැබූ හෝ දින සිට මාසයක් ඇතුළත දී දේශීය ආදායම් කොමසාරිස්ගෙන් නොලැබුණ හොත්, කිසිදු මුදල් ප්‍රමාණයක් අත්හිටුවා ගැනීම අනවශ්‍ය වූවාක් මෙන් බැංකුව විසින් ක්‍රියා කළ යුතුය.

(8) නාමිතයකු විසින්—

(අ) තමා ඒ නාමිතයා බව ප්‍රකාශ කැරෙන දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබුව හොත් ; සහ

(ආ) තම අනන්‍යතාව ඔප්පු කිරීමේ සහතිකයක් බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි තැනැත්තකුගෙන් ලබා ගෙන ඉදිරිපත් කළ හොත්

මිස, කිසිදු නාමිතයකුට බැංකුව විසින් කිසිදු ගෙවීමක් නොකළ යුතුය.

(9) මිය ගියා වූ නාමකයකුගේ යම් නාමිතයකු හට, (6) වන උපවගන්තිය යටතේ යම් අඩුකිරීමක් කළ යුතුව තිබුණේ නම් ඒ අඩුකිරීමට යටත් කොට සහ (8) වන උපවගන්තියේ සඳහන් කොන්දේසිවලට යටත් කොට කරනු ලැබූ ගෙවීමක්, ඒ නාමකයාගේ බැරට ඇති මුදල් සම්බන්ධයෙන් බැංකුවේ වගකීම්වලින් සම්පූර්ණ නිදහස් වීමක් වන්නේ ය.

(10) තැන්පත් ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් ඇත්තාවූ ද නාමකයකු නොවන්නා වූ ද යම් තැනැත්තකු මිය ගිය විට ඔහුගේ බැරට යම් මුදල් ප්‍රමාණයක් බැංකුවෙහි ඇති කල්හි, ඒ තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් නොතබා මිය ගොස් ඇති බවට හා ඒ තැනැත්තාගේ මුදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් යම් ලිඛිත නීතියක් යටතේ අවශ්‍ය නොවන බවට, ගිණුම් පිළිබඳ ගෙවීම් කිරීමට යථා පරිදි බලය

සැහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, තත් කාර්යය සඳහා වූ යම් රීතියක් අනුව යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවීමට නියමිත මුදල් ප්‍රමාණ මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවිය හැකිය:

එසේ වුව ද, තත් කාර්යය සඳහා රීති සාදනු ලබන තෙක්, එවැනි යම් මුදල් ප්‍රමාණයක්, ඊට නීත්‍යානුකූලව හිමිකම දරන තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවිය හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 සිට 32 දක්වා වූ වගන්ති ප්‍රතිශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31 සහ 32 යන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්ති ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"ගෙවීම පැහැර හැරීම.

15. චංචල හෝ නිශ්චල දේපලක් උකසට තබා ගෙන දෙන ලද යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් අය විය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර තිබුන හොත්, ඒ මුදල අය වීමට ඇත්තේ මුල් මුදල සම්බන්ධයෙන් වුව ද, පොලිය සම්බන්ධයෙන් වුව ද ඒ දෙකම සම්බන්ධයෙන් වුව ද, ඒ පැහැර හැරීම ඒ ණය මුදලේ, අයිරා අණකරයේ, අත්තිකාරමේ හෝ වෙනත් අනුග්‍රහ මුදලේ නොගෙවා ශේෂව ඇති සම්පූර්ණ ප්‍රමාණය ම සහ ඊට එදිනට අයවිය යුතු පොලිය ද සම්බන්ධයෙන් කරනු ලැබූ පැහැර හැරීමක් ලෙස සලකනු ලැබේ.

පැහැර හැරීමක් කර ඇතිවිටක මණ්ඩලය විසින් ගත හැකි ක්‍රියාමාර්ගය.

16. මේ ආඥාපනතේ විධිවිධාන යටතේ යම් ණය මුදලක, අයිරා අණකරයක, අත්තිකාරමක හෝ වෙනත් අනුග්‍රහ මුදලක නොගෙවා ශේෂ වී ඇති සම්පූර්ණ ප්‍රමාණය ම සහ ඊට අය විය යුතු පොලිය ද සම්බන්ධයෙන් පැහැර හැරීමක් කර ඇති හෝ කර ඇතැයි සලකනු ලබන හෝ අවස්ථාවක දී, මණ්ඩලය විසින්, තම අභිමතය පරිදි, 17 වන වගන්තියෙහි හෝ 19 වන වගන්තියෙහි සඳහන් පරිදි ක්‍රියා කළ හැකිය :

එසේ වුව ද, මණ්ඩලය විසින් කවර අවස්ථාවක දී හෝ 17 වන වගන්තියට අනුකූල ව ක්‍රියා කර ඇති විටක හෝ ක්‍රියා කිරීමට ආරම්භ කර ඇති විටක, අවශ්‍යයයි හෝ උචිතයයි මණ්ඩලය අදහස් කරන්නේ නම්, තදනන්තර ව කවර වේලාවක දී වුව ද 19 වන වගන්තිය යටතේ වූ යෝජනාවක් සම්මතකර ගැනීමෙන් ඒ කරුණ ම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ක්‍රියා කිරීම කිසිවක් මගින් වැළැක්වෙනවා නොසැලකිය යුතුය

උකස් කළ දේපලෙහි සන්තකය භාර ගැනීමට කළමනාකරු වෙත බලය පැවරීම.

17. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැරීමක් කර ඇති විටක, ඒ ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල සඳහා ඇප වශයෙන් බැංකුව වෙත උකස් කර ඇති යම් නිශ්චල දේපලකට ඇතුළු වී එහි සන්තකය භාර ගැනීමට හෝ එසේ උකස් කර ඇති යම් චංචල දේපලක් අල්ලා ගැනීමට ද, ඒ දේපල පාලනය කිරීමට හා නඩත්තු කිරීමට ද, උකස්කරු විසින් ගෙවීම පැහැර හරිනු නොලැබුයේ නම් ඒ උකස්කරු විසින් ඒ දේපලෙහි පාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබිය හැකිව තිබුණු බලතල එසේම පාවිච්චි කිරීමට ද බලය, 20 වන වගන්තියේ විධිවිධාන වලට යටත් ව, ලිඛිතව වාර්තා ගත කළ යුතු යෝජනාවක් සම්මතකර ගැනීමෙන් මණ්ඩලය විසින්, ඒ යෝජනාවේ නිශ්චිත ව සඳහන් තැනැත්තකු වෙත පැවරිය හැකිය.

කළමනාකරු පත් කිරීමෙන් පසු කාර්ය පරිපාටිය.

18. (1) 17 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවකින් යම් දේපලක් සම්බන්ධයෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට ඒ යෝජනාවේ සඳහන් නියමයන්ට අනුකූල ව සාමාන්‍ය වශයෙන් ක්‍රියා කිරීමේ හිමිකම ඇති අතර, විශේෂයෙන්,—

(අ) ඒ දේපලෙහි පලදාව විකිණීමේ;

(ආ) ඒ දේපලෙන් බදු, ලාභ හෝ වෙනත් ආදායම් ලබා ගැනීමේ;

(ඇ) ඒ දේපල පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වැය වන මුදල් ඒ දේපලෙහි ආදායමින් ගෙවීමේ;

(ඈ) තම සේවාවන් සඳහා පාරිශ්‍රමික වශයෙන් මණ්ඩලය විසින් සුදුසුයයි සලකා නියම කරන ලද මුදල් ප්‍රමාණයක් වෙතොත් එය එම ආදායමින් තමාට ලබා ගැනීමේ;

(ඉ) ඒ දේපල බැඳුණු උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් හෝ (2) වන උප වගන්තිය යටතේ ඒ දේපලෙහි සන්තකය අත් හැරීමට මණ්ඩලය විසින් තමාට නියම කරනු ලබන තෙක් හෝ ඒ දේපල තම සන්තකයේ තබා ගැනීමේ

හිමිකම ඔහුට තිබේ.

(2) 17 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවක් මගින් යම් දේපලක් සම්බන්ධයෙන් බලය පවරන ලද සෑම තැනැත්තකු විසින්—

(අ) මණ්ඩලය විසින් තම අභිමතය පරිදි නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් වේතොත් එය ඒ දේපලෙහි ආදායමින් ණයපත්‍ර උකස්කරුගේ නඩත්තුව සඳහා ඔහුට ගෙවිය යුතුය ;

(ආ) මෙහි ඉහත බලය දෙන ලද ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපලෙහි ආදායමෙන් ඉතුරු වන මුදල මණ්ඩලය විසින් නියම කරනු ලබන තැනැත්තකුට හෝ තැනැත්තන්ට මණ්ඩලය විසින් නියම කරනු ලබන ආකාරයකට ත්‍රෛමාසික වශයෙන් හෝ මණ්ඩලය විසින් නියම කරනු ලබන අන් ලෙසකින් හෝ ගෙවිය යුතුය ;

(ඇ) ඒ දේපල සම්බන්ධයෙන් තමාට ලැබුණු හෝ තමා විසින් ගෙවන ලද හෝ සියලු මුදල් ප්‍රමාණ පිළිබඳ ව සැහැදිලි හා නිවැරදි වාර්තා තැබිය යුතු අතර, මණ්ඩලය විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේද ඇතුළත දී මණ්ඩලය වෙත ඒ වාර්තා ඉදිරිපත් කළ යුතුය ;

(ඈ) මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි ඒ දේපලෙහි සන්තකය උකස්කරුට හෝ වෙනා යම් තැනැත්තකුට හෝ භාර දිය යුතු අතර, මෙහි ඉහත බලය පවරන ලද ගෙවීම් කිරීමෙන් පසු එම දේපලෙහි ආදායමින් තම අතෙහි ඉතුරු වන යම් ශේෂයක් වේ නම් එය මණ්ඩලයට ගෙවිය යුතුය.

(3) උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම වූ පසු උකස් කළ දේපලෙහි සන්තකය මණ්ඩලය විසින් උකස්කරු වෙත භාර දිය යුතු අතර, ඒ දේපලෙහි ආදායමින් යම් මුදලක් ඉතුරුවී තිබේ නම් එයද ඔහු වෙත භාර දිය යුතුය.

උකස් කළ දේපල විකිණීමට බලය දීම.

19. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී ඒ ණයෙන්, අයිරා අණකරයෙන්,

නොගෙවා ඉතිරි වී ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණයත් විකිණීම කරන දිනය දක්වා ඒ සඳහා අය විය යුතු පොලියත් 26 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් ප්‍රමාණ සහ ගාස්තු ද සමග අය කර ගැනීම සඳහා ඒ ණය, අයිරා අණකරය, අත්තිකාරම් හෝ අනුග්‍රහ මුදල සඳහා බැංකුවට උකස් තබා ඇති යම් නිශ්චල හෝ චංචල දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ බලය, ලිඛිත ව වාර්තා කර තැබිය යුතු යෝජනාවක් සම්මත කර ගැනීමෙන්, ඒ යෝජනාවේ නිශ්චිතව සඳහන් තැනැත්තකු වෙත, මණ්ඩලය විසින්, 20 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව පැවරිය හැකිය.

ණය ගැනුම්කරු මිය ගොස් ඇති විට.

20. (1) (2) වන උපවගන්තියෙන් අන් ලෙස කින් විධිවිධාන සලස්වා තිබුණ හොත් මිස, ණය ගැණුම්කරු මිය ගොස් තිබුණේ වුව ද නැතහොත් ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල සඳහා ඇප වශයෙන් උකස් කරන ලද දේපලෙහි යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් කළ පැවරීමක් මගින් නැතහොත් නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙනත් යම් තැනැත්තකු වෙත පැවරී තිබුණේ වුවද, යම් පැහැර හැරීමක් වූ විටක දී 17 වන වගන්තියේ සහ 19 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) ණයකරු මිය ගොස් ඇත්තා වූ ද ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපත්‍රය නිකුත් කර නොමැත්තා වූ ද අවස්ථාවක දී, මණ්ඩලය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි කිසිවකු සිටිත් නම් ඔවුන් වෙත ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීම භාර දීමෙන් පසු, ප්‍රොබේට් බල පත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය නිකුත් කිරීම අනිසි ලෙස ප්‍රමාද වීමට ඉඩ ඇතැයි අධිකරණය සැහීමට පත් වුව හොත් කොළඹ දිසා අධිකරණය විසින් හෝ ඒ දේපල පිහිටි හෝ තබා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ ණයකරුගේ බූදලය නියෝජනය කිරීමට කෙනකු පත් කරනු ලැබිය හැකිය. තවද මේ වගන්තිය යටතේ තම බූදලය නියෝජනය කරන තැනැත්තකු පත් කරනු ලැබුවහොත් සහ පත් කරනු ලබන තුරු, ණයකරු විසින් කරන ලද යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන්, 17 වන සහ 10 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවන්නේ ය.

උකස් කළ දේපළ විකිණීම සඳහා මණ්ඩලයේ යෝජනාව පිළිබඳ දන්වීම.

21. යම් දේපලක් විකිණීමට බලය පවරමින් 19 වන වගන්තිය යටතේ සම්මත කර ගනු ලබන සෑම යෝජනාවක් ම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ සහ පිළිවෙලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකරනු ලබන දිනපතා පුවත් පත් තුනක ප්‍රසිද්ධ කළ යුතු අතර, ණයකරු ජීවත් ව සිටී නම්, ඒ දැන්වීමේ පිටපත් ඔහු වෙත භාර දෙනු ලැබිය යුතුය.

විකිණීම පිළිබඳ දන්වීම.

22. සෑම විකිණීමක ම, දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක්, ඒ විකිණීම සඳහා නියම කර ගත් දිනයට දහහතර දිනකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු අතර, ඒ දැන්වීමෙහි පිටපත්,—

(අ) ණයකරු ජීවත් ව සිටී නම් ඔහු වෙත භාර දෙනු ලැබිය යුතුය ;

(ආ) නිශ්චල දේපල විකිණීමට ඇති අවස්ථාවක දී නම්, ඒ දේපල මත හෝ ඒ අසල අලවා තැබිය යුතු ය ; තවද

(ඇ) කච්චේරියේ බිත්තිවල සහ ඒ දේපල පිහිටි හෝ තබා ඇති ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ කීපයේ බිත්තිවල අලවා තැබිය යුතු ය.

විකිණීමට කලින් ගෙවීම.

23. (1) ණයෙන්, අයිරා අණකරයෙන්, අත්තිකාරමෙන් හෝ වෙනත් අනුග්‍රහ මූදලෙන් (උකස් නියමයන්ට අනුකූල ව ඒ සඳහා ගෙවිය යුතු සියලු පොලී ද ඇතුළු ව) නොගෙවා ඉතිරි ව ඇති සම්පූර්ණ මුදල සහ මණ්ඩලය විසින් 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් සහ ගාස්තු වෙතොත් ඒවා ද විකිණීම සඳහා නියම කර තිබෙන දිනයට පෙරාතුව යම් වේලාවක දී මණ්ඩලය වෙත භාර දෙනු ලැබුව හොත්, ඒ දේපල නොවිකිණිය යුතු අතර ඒ දේපල විකිණීම සඳහා 19 වන වගන්තිය යටතේ වූ යෝජනාව ප්‍රකාර වැඩිදුර කිසිදු පියවරක් ගැනීම නොකළ යුතුය.

(2) පැහැර හැරීම සිදුවී ඇත්තේ යම් වාරික යක් නැතහොත් වෙනත් ගෙවීමක් සම්බන්ධ යෙන් ද ඒ වාරිකය හෝ ගෙවීම, ඒ සඳහා උකසේ නියමයන්ට අනුකූල ව ගෙවිය යුතු පොලිය ද මණ්ඩලය විසින් 26 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදලක් හෝ ගාස්තුවක් වෙතොත් එය ද සමග, විකිණීම සඳහා නියම කර තිබෙන දිනයට පෙරාතුව යම් වේලාවක දී මණ්ඩලය වෙත භාරදෙනු ලැබුව හොත් අදාළ දේපල නොවිකිණිය

යුතු බවට ද ඒ දේපල විකිණීම සඳහා 19 වන වගන්තිය යටතේ වූ යෝජනාව ප්‍රකාර වැඩිදුර කිසිදු පියවරක් ගැනීම නොකළ යුතු බවට ද මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි විධාන කළ හැකිය.

**අවම වෙන්දේසි මිල.**

24. අදාළ දේපල විකිණිය හැකි අවම වෙන්දේසි මිලක් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකිය. ඒ දේපල ඒ මිලට වඩා අඩු මිලකට බැංකුවට හැර වෙනත් තැනැත්තකුට නොවිකිණිය යුතුය.

**එකම දේපලක් මත ලබා ඇති ණය කීපයකින් එකක් ගෙවීම පැහැර හැරීම.**

25. එකම දේපල ඇපයට තබාගෙන බැංකුව විසින් ණය, අයිරා අණකර, අත්තිකාරම් හෝ වෙනත් අනුග්‍රහ මුදල් එකකට වඩා දී ඇත්තා වූ ද එබඳු ණය, අයිරා අණකර, අත්තිකාරම් හෝ වෙනත් අනුග්‍රහ මුදල් එකක් හෝ වැඩි ගණනක් වෙනුවෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද යම් අවස්ථාවක, වෙනත් යම් කිසි ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් සිදුවී නොමැති වුව ද මේ පනතේ මීට පූර්වයෙන් වූ විධිවිධාන අදාළ වන අතර එබඳු යම් කාරණයක් සම්බන්ධයෙන් අවස්ථාචෝචිත පරිදි ඒ සියලු ණය, අයිරා අණකර, අත්තිකාරම් සහ වෙනත් අනුග්‍රහ මුදල් වෙනුවෙන් බැංකුවට අයවිය යුතු මුළු මුදල අය කර ගැනීම සඳහා ඒ දේපල විකිණීමට 19 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් මණ්ඩලය විසින් බලය දිය හැකි අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ වන්නේය.

**බැංකුවට දරන්නට සිදුවූ පිරිවැය සහ වියදම් අයකර ගැනීම.**

26. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් බැංකුවට අයවිය යුතු මුදලට අතිරේක ව, මණ්ඩලය විසින්,—

(අ) අදාළ ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල දෙනු ලැබූ තැනැත්තා ලියා අත්සන් කළ උකස්කරයේ ඇතුළත් පොරොන්දුවලට අනුකූල ව බැංකුව විසින් වැය කරන ලද හෝ බැංකුවට උකස් කරන ලද දේපල සඳහා ලබාගන්නා ලද රක්ෂණ සහතිකයක් වේ නම් ඒ සඳහා වාරික සහ වෙනත් ගාස්තු ගෙවීම සඳහා ද එකී උකස්කරයේ ඇතුළත් පොරොන්දු යටතේ බැංකුව විසින් දැරීමට බලය ලැබී ඇති වෙනත් සියලු පිරිවැය සහ ගාස්තු ගෙවීම සඳහා ද බැංකුව විසින් වැය කරන ලද සියලු මුදල්; සහ

(ආ) විකිණීම ප්‍රචාරය කිරීම සඳහා සහ උකස් කළ දේපල විකිණීම සඳහා වූ පිරිවැය ණය ගැනුම්කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගෙන් අයකර ගත හැකිය :

එසේ වුව ද මේ ඡේදය යටතේ දරන පිරිවැය, ඒ ණයෙන්, අයිරා අණකරයෙන්, අත්තිකාරමෙන් හෝ වෙනත් අනුග්‍රහ මුදලෙන් මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවක් මගින් කලින් කල නියම කරනු ලබන යම් සියයට ගණනක් නොඉක්මවිය යුතුය.

ඉතිරි ශේෂය ගෙවීම.

27. උකස් කළ දේපල විකුණනු ලැබුව හොත් විකිණීමෙන් ලැබුණු මුදලෙන් උකස වෙනුවෙන් අයවිය යුතු මුදල ද 26 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල සහ ගාස්තු ද අඩු කර ගත් පසු ශේෂයක් ඉතිරි වෙතොත් එය ණය ගැනුම් කරුට හෝ ණය ගැනුම්කරුට ලැබිය යුතු ගෙවීම් භාරගැනීමට නීත්‍යානුකූල ව හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ, ඒ මුදල් ගෙවිය යුත්තේ කවුරුන්හට ද යන්න ගැන මණ්ඩලයට සැකයක් ඇති විට දී, උකස් කළ දේපල පිහිටා ඇති හෝ තබා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත හෝ මණ්ඩලය විසින් ගෙවිය යුතුය.

විකුණුම් සහතිකය.

28. (1) උකස් කරනු ලැබූ දේපල විකුණනු ලැබුව හොත් මණ්ඩලය විසින් විකුණුම් සහතික යක් අත්සන් කළ යුතුය ; එවිට ඒ දේපලට සහ ඒ දේපල පිළිබඳ ණය ගැනුම්කරුට ඇති සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා, ගැනුම් කරු වෙත පැවරෙන්නේ ය. තව ද ඉන්පසු ව ඒ දේපල බැංකුවට උකස් කරනු ලැබූ දිනයෙන් පසු ව ඒ දේපලට හෝ ඒ දේපල පිළිබඳ ව ණය ගැනුම් කරුට ඇති අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතා පිළිබඳ ව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද කවර ආකාරයේ වූ හෝ බැහැර කිරීමක් මගින් හෝ එවැන්නක් යටතේ හෝ හිමිකම් පාන කවර තැනැත්තකු විසින් වුවද කවර හේතුවක් නිසා හෝ ඒ විකිණීම අවලංගු කරන ලෙස කිසි ම අධිකරණ යකින් ඉල්ලා සිටීම හෝ ගැනුම්කරුට ප්‍රතිපක්ෂව ඒ දේපල හෝ ඒ දේපල පිළිබඳ ව ඇති යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම නොකළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සහතිකයක්, යම් දේපලක් විකිණීම සම්බන්ධයෙන් මේ පනතේ සියලු විධිවිධාන ඒ දේපල විකිණීම හා සම්බන්ධ යෙන් පිළිපදින ලද බවට තීරණාත්මක සාක්ෂිය වන්නේ ය.

(3) ගැනුම්කරු බැංකුව නොව අන් තැනැත්තකු නම් විකුණුම් සහතිකය මෙහි තුන්වන උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතුය. ගැනුම්කරු බැංකුව නම් විකුණුම් සහතිකය එකී උපලේඛනයේ "ආ" ආකෘතියට සාරානුකූල විය යුතුය.

(4) සෑම විකුණුම් සහතිකයක් ම, එය දේපල පවරා දීමක් වූයේ නම් යටත් විය යුතු මුද්දර ගාස්තුවලට ද ගාස්තුවලට ද යටත් වන අතර නීතියෙන් බලය ලැබී ඇති යම් ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට සහ වෙනත් ගාස්තුවලට ද යටත් වන්නේය. ඒ සියලු ම ගාස්තු ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

භුක්තිය භාරදීම සඳහා වූ ආඥාව.

29. (1) මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර විකුණනු ලැබූ නිශ්චල දේපලක ගැනුම්කරු විසින් කොළඹ දිසා අධිකරණය වෙත හෝ ඒ දේපල පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සහ 28 වන වගන්තිය යටතේ ඒ දේපල සම්බන්ධයෙන් නිකුත් කරන ලද විකුණුම් සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ දේපලෙහි සන්තකය භාරදීම සඳහා වූ ආඥාවක් ලබාගැනීමට ඔහුට හිමිකම තිබේ.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ඉදිරිපත් කිරීම ද ඒ පිළිබඳ සුදුස්සක් කිරීම ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල ලඝුකෘත්‍ය ක්‍රමයට කළ යුතුය ; තව ද එබඳු එක් එක් ඉල්ලීමේ කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ම ලේඛන වෙනුවෙන් ද ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන සියලු නඩු කටයුතු වෙනුවෙන් ද ඒ ඉල්ලීම අදාළ වන දේපල හා සමාන වටිනාකමක් ඇති නිශ්චල දේපලක භුක්තිය භාරදීම පිණිස වූ දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් සහ ඒවා ක්‍රියාවෙහි යෙදවීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික නඩු කටයුතු වෙනුවෙන් තත් කාලයෙහි වලංගු ව පවතින ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු ප්‍රමාණයන් අනු ව මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම් ගෙවිය යුතුය.

(3) මේ ආඥාපනතේ මීට පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර විකුණනු ලැබූ යම් නිශ්චල දේපලක පදිංචිය, ණයගැනුම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ දේපල බැංකුව වෙත උකස් කිරීමෙන් පසු ව ණයගැනුම්කරු ඇති කළ හිමිකමක් යටතේ අයිති

තම කියා සිටින තැනැත්තකු විසින් හෝ දරනු ලබන විට, ගැනුම්කරුට හෝ තමා වෙනුවෙන් ඒ දේපලෙහි භුක්තිය භාර ගැනීමට ඔහු විසින් පත් කරනු ලැබිය හැකි යම් තැනැත්තකුට ඒ දේපලෙහි භුක්තිය භාර දීමෙන් එහි භුක්තිය භාර දෙන ලෙස දිසා අධිකරණය විසින් අණ කළ යුතුය.

(4) මේ ආඥාපනතේ මීට පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර විකුණනු ලැබූ යම් චංචල දේපලක බදුකරුවකු හෝ එහි පදිංචි වීමට හිමිකම ඇති වෙනත් යම් තැනැත්තකු පදිංචිව සිටින අවස්ථාවක, විකිණීම සිදු කරනු ලැබූ බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ දැන්වීමක් ඒ දේපලෙහි ප්‍රකට ස්ථානයක ඇලවීමෙන් සහ ණයගැනුම්කරුගේ සම්බන්ධතාව ගැනුම්කරුට පවරා දෙන ලද බව යම් පහසු ස්ථානයක අණ බෙර ගැසීමෙන් හෝ ව්‍යවහාරයෙහි පවතින වෙනත් යම් ක්‍රමයකින් පදිංචිකරුට ප්‍රකාශ කිරීමෙන් භාරදීම කරන ලෙස දිසා අධිකරණය විසින් අණ කළ යුතුය. එසේ ප්‍රකාශ කිරීමේ ගාස්තුව අධිකරණය විසින් නියම කළ යුතු අතර සෑම අවස්ථාවක දී ම එය ගැනුම්කරු විසින් කලින් ගෙවිය යුතුය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ කරනු ලැබූ සෑම ආඥාවක් ම අවස්ථාවෝචිත පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන හෝ 288 වන වගන්ති යටතේ කරන ලද භුක්තිය භාරදීම සඳහා වූ ආඥාවක් ලෙස සැලකිය යුතු අතර ඒ සංග්‍රහයේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා ණය ගැනුම්කරු සහ ගැනුම්කරු පිළිවෙළින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ණයහිමියා ලෙස සලකා, එසේ කරන ලද එවැනි ආඥාවක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ම ක්‍රියාත්මක කළ හැකිය.

**විකිණීම අවලංගු කිරීම.**

30. (1) විකුණන ලද දේපල බැංකුව වෙනුවෙන් මිලයට ගෙන ඇත හොත්, එම දේපල විකුණන ලද්දේ යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ද, එකී ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ අනුග්‍රහ මුදල වෙනුවෙන් (තහනමට ගැනීමේ හා විකිණීමේ ගාස්තු ඇතුළත් ව) ගෙවිය යුතු මුදල සහ නියමිත ප්‍රමාණය නොඉක්ම වූ ප්‍රමාණයක් අනු ව මුළු මුදල වෙනුවෙන් ගණන් බලන ලද පොලිය ණය ගැනුම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන් අන් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ පසු, මණ්ඩලය විසින් එම දේපල නැවත විකුණනු ලැබීමට පෙර කවර වේලාවක වුව ද විකුණුම් සහතිකයෙහි සහතික පිටපතක ඒ විකිණීම අවලංගු කළ බවට පිටසනක් කිරීමෙන් විකිණීම අවලංගු කළ හැකිය.

(2) අදාළ දේපල—

(අ) චංචල දේපලක් නම් පිටසත් කරනු ලැබූ වහාම ද

(ආ) නිශ්චල දේපලක් නම් ඉඩම් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට ද

මේ ආඥාපනත යටතේ විකිණීම සිදු නොකරන ලද්දාක් සේ ඒ දේපල ණයගැනුම්කරු වෙත ආපසු පවරා දීමේ බලය මේ වගන්තිය යටතේ කරනු ලැබූ පිටසනක ඇත්තේය.

බැංකුව විසින් නැවත විකිණීම.

31. (1) විකුණනු ලැබූ දේපල බැංකුව වෙනු වෙන් මිල දී ගෙන ඇත හොත් සහ ඒ විකිණීම 30 වන වගන්තිය යටතේ අවලංගු කරනු නොලැබූ ව හොත් මණ්ඩලය විසින් කවර වූ හෝ වේලාවක දී ඒ දේපල නැවත විකුණා, මුල් විකිණීමේ දී ගැනුම්කරුට ලැබිය හැකි ව තිබුණු සියලු ම අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා 28 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ සහතික කළ පිටපතක කරනු ලබන පිටසනකින් ගැනුම්කරුට පවරා දිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ කරනු ලබන පිටසනක් මුල් විකිණීමේ දී ගැනුම්කරුට නිකුත් කරනු ලබන සහතිකයක් යටත්වන මුද්දර ගාස්තු වලට ම සහ ගාස්තුවලට ම යටත් වන අතර අදාළ දේපල—

(අ) චංචල දේපලක් නම් පිටසත් කරනු ලැබූ වහාම ද

(ආ) නිශ්චල දේපලක් නම් ඉඩම් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට ද

මේ ආඥාපනත යටතේ විකිණීම සිදු නොකරන ලද්දාක් සේ ඒ දේපල ගැනුම්කරු වෙත ආපසු පවරා දීමේ බලය එබඳු පිටසනක ඇත්තේය.

අයකර ගැනීමේ වෙනත් ක්‍රම යොදා ගැනීමෙන් මණ්ඩලය නොවැළැක්වෙන බව.

32. 10 වන වගන්තියේ සිට 31 වන වගන්තිය දක්වා වූ වගන්තිවල ඇතුළත් කිසිවකින්, යම් කිසි උකස්කරයකු මත අය විය යුතු මුදල් වෙත යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල ව අයකර ගැනීමෙන් මණ්ඩලය වළක්වනු ලබන ලෙස නොසැලකිය යුතුය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මණ්ඩලයට මඟ නිධානයේ අමාත්‍යවරයාගේ බලතල.

33. අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා බැංකුවේ ව්‍යාපාර කටයුතු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලක් මගින් කළ හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ සිට 40 වන වගන්තිය දක්වා වූ වගන්ති (ඒ වගන්ති දෙක ම ඇතුළු ව) මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ සිට 40 වන වගන්තිය දක්වා වූ වගන්ති ඉවත් කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ සිට 55 වන වගන්තිය දක්වා වූ වගන්ති (ඒ වගන්ති දෙක ම ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ සිට 55 වන වගන්තිය දක්වා වූ වගන්ති ඉවත් කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කාර්ය මණ්ඩලය පත්කිරීම.

56. (1) යටත් කාර්ය මණ්ඩලය ඇතුළු ව බැංකුවේ කාර්ය මණ්ඩලය පත් කිරීමේ බලය මණ්ඩලයට තිබේ :

එසේ වුව ද අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ලියවිල්ලකින් ලබා නොගෙන සාමාන්‍යාධිකාරිවරයා පත් කරනු නොලැබිය යුතුය :

එසේ ම තවදුරටත්, සාමාන්‍යාධිකාරිවරයා නොමැති විටක ඔහු වෙනුවෙන් වැඩබැලීමට බැංකුවේ නිලධරයකු මාස හතරකට නොවැඩි කාලසීමාවක් සඳහා පත්කරනු ලබන්නේ නම් ඒ පත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතිය අවශ්‍ය නොවේ.

(2) මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමතිය ඇති ව යම් නිලධරයකුගේ හෝ බැංකුවේ යටත් කාර්ය මණ්ඩලයේ සේවකයකුගේ වැටුප්, පඩිනඩි, ගමන් වියදම් දීමනා, අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් කලින් කල වෙනස් කිරීම හෝ පරිශෝධනය කිරීම කළ හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය එහි (1) වන උප වගන්තිය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) සෑම නිලධරයකු සහ බැංකුවේ යටත් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් ම තම කාර්ය යථා පරිදි හා හිතෛෂීව ඉටු කිරීම විෂයෙහිලා මණ්ඩලය සෑහීමට පත් වන පරිදි ඇප තැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

'සාමාන්‍යාධිකාරිවරයා සේවයෙන් අස් කිරීම.

58. බැංකුවේ කිසි ම සාමාන්‍යාධිකාරිවරයකු—

(අ) තත් කාලයෙහි ධුර දරන බැංකුවේ අධ්‍යක්ෂවරයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් මණ්ඩලය විසින් සම්මත කරන යෝජනාවක් අනුව ; සහ

(ආ) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතිය ඇති ව

මිස සේවයෙන් අස් නොකළ යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

"බැංකුව වෙනුවෙන් කරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම.

60. බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ වෙනත් නිලධරයකු විසින් තම කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමෙහිලා ඔහු විසින් දරනු ලැබූවා වූ ද ඔහුගේ විෂමාචාරය නිසා නැතහොත් ඕනෑකමින් ම කරන ලද පැහැර හැරීමක් නිසා සිදු වූ පාඩු සහ වියදම් යයි මණ්ඩලය විසින් සලකනු ලබන පාඩු සහ වියදම් නොවන්නා වූ ද සියලු පාඩු සහ වියදම් සම්බන්ධයෙන් බැංකුව විසින් ඔහුට වන්දි ගෙවිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, එහි (අ) ඡේදය වෙනුවට මෙහි පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) එම කරුණු එළිදරව් කරන ලෙස,—

(i) අධ්‍යක්ෂවරුන් විසින් නියම කරනු ලැබුව හොත් හෝ

(ii) අධිකරණයක් විසින් නියම කරනු ලැබුව හොත් හෝ

(iii) ඒ කරුණු අදාළ වන තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබුව හොත් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"ලේඛන පරීක්ෂා කිරීම.

64. බැංකුවේ අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු, ගණකාධිකාරිවරයකු හෝ ලිපිකරුවකු නැතහොත් බැංකුවේ පොත්, ගණන්, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් පරීක්ෂා කිරීමට තමාට පැවරී ඇති කාර්ය අනුව නියම කරනු ලබන වෙනත් තැනැත්තකු නොවන කිසි ම තැනැත්තකුට, යම්කිසි ලිඛිත නීතියක් යටතේ ඒවා පරීක්ෂා කිරීම සඳහා බලය ලැබී ඇත්නම් මිස, බැංකුවේ පොත්, ගණන්, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් පරීක්ෂා කිරීමේ අයිතියක් නැත.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අදාළවීම.

65. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බැංකුවේ මුදල් පාලනය සහ ගණන් කෙරෙහි අදාළ වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන සහ 67 වන වගන්ති ඉවත් කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන සහ 67 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන සහ 69 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන සහ 69 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්ති ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"බැංකුවට අයවිය යුතු ණය කෙරෙහි මුදල් ණයට දීමේ ආඥාපනත, ණය බේරීමේ ආඥාපනත සහ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත අදාළ නොවිය යුතු බව.

68. මුදල් ණයට දීමේ ආඥාපනතේ, ණය බේරීමේ ආඥාපනතේ හෝ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ ඇතුළත් කිසිවක්, බැංකුවට අයවිය යුතු කිසි ම ණයක් කෙරෙහි අදාළ නොවන අතර එසේ අදාළ වන්නාක් සේ හෝ එවැනි යම් ණයක් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් බැංකුවට ඇති අයිතිවාසිකම්වලට හානිකර වන්නාක් සේ නැතහොත් බලපාන්නාක් සේ නොසැලකිය යුතුය.

බැංකුවට අයවිය යුතු ණය කෙරෙහි බඩු උකස් ගන්නන්ගේ ආඥාපනත

69. බැංකුව බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරගෙන යන අවස්ථාවන්හි බඩු උකස් ගන්නන්ගේ ආඥාපනත බැංකුව කෙරෙහි අදාළ නොවන්නේය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ සිට 69ඈ දක්වා වූ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියට ඉක්බිති ව ම මෙහි පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියේ 69අ, 69ආ, 69ඇ සහ 69ඈ වන වගන්ති වශයෙන් බලපැවැත්වේ.

"රබර් පාලන පනතින් නියමිත ප්‍රමාණය ඉක්මවන රබර් ප්‍රමාණයක් බැංකුව විසින් සන්තකයේ තබාගත හැකි බව.

69අ. රබර් පාලන පනතේ 10 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ පනතේ නියමිත ප්‍රමාණය ඉක්මවන රබර් ප්‍රමාණයක් බැංකුව විසින් නීත්‍යානුකූල ව සන්තකයේ තබා ගත හැකිය.

1957 අංක 51 දරන තේ පාලන පනතින් නියමිත ප්‍රමාණය ඉක්මවන සකස් කළ තේ ප්‍රමාණයක් බැංකුව විසින් සන්තකයේ තබා ගත හැකි බව.

69ආ. 1957 අංක 51 දරන තේ පාලන පනතේ 15 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ පනතේ නියමිත ප්‍රමාණය ඉක්මවන සකස් කළ තේ ප්‍රමාණයක් බැංකුව විසින් නීත්‍යානුකූල ව සන්තකයේ තබා ගත හැකිය.

සිල්ලරට විකිණිය හැකි බව ප්‍රකාශිත සීමාව ඉක්මවන ප්‍රමාණයක සුරා බද්දට යටත් භාණ්ඩ බැංකුව විසින් සන්තකයේ තබා ගත හැකි බව.

69ඇ. සුරාබදු ආඥාපනතේ 17 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද සුරා බද්දට යටත් භාණ්ඩ සිල්ලරට විකිණිය හැකි සීමාව වශයෙන් ඒ ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රකාශිත ප්‍රමාණය ඉක්මවන ප්‍රමාණයක සුරා බද්දට යටත් භාණ්ඩ බැංකුව විසින් නීත්‍යානුකූල ව සන්තකයේ තබා ගත හැකිය.

19 වන වගන්තිය යටතේ විකිණීමට බලය ලැබී ඇති දේපල පවරාදීම සම්බන්ධයෙන්, 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කොටස්කිරීම පාලනය කිරීමේ) පනත අදාළ නොවිය යුතු බව.

69ඈ. මේ ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ විකිණීමට මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ යම් නිශ්චල දේපලක අයිතිය බැංකුව විසින් පැවරීම කෙරෙහි 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කොටස් කිරීම පාලනය කිරීමේ) පනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය ඉවත් කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය ඉවත් කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "බැංකුව" යන්නෙහි අර්ථනිරූපණයට පෙරාතුව ම මෙහි පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"අනුමත සමිතිය" යන්නෙන් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මේ ආඥාපනතේ කාර්ය සඳහා අනුමත කරනු ලැබූ සංගමයක් අදහස් වේ;

(ආ) "ප්‍රාග්ධනය" යන්නෙහි අර්ථනිරූපණයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"මධ්‍යම කාර්යාලය" යන්නෙන් බැංකුවේ මධ්‍යම කාර්යාලය අදහස් වේ;

(ඇ) "භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්" යන්නෙහි අර්ථනිරූපණය ඉවත් කිරීමෙන්;

(ඈ) "තෝරා පත්කර ගත් අධ්‍යක්ෂ", "අතිවිශේෂ යෝජනාව" සහ "මහා සභා රැස්වීම" යන පාඨවල අර්ථනිරූපණ ඉවත් කිරීමෙන්;

(ඉ) "ප්‍රධාන කාර්යාලය" යන්නෙහි අර්ථනිරූපණය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථනිරූපණය ආදේශ කිරීමෙන් :—

"ණය" යන්නට මුදල් ලබාගැනීමේ හෝ මුදලින් වටිනාකම ලබාගැනීමේලා දේපල පිළිබඳ බැඳීමක් ඇතුළත් වේ;

(ඊ) "සාමාන්‍ය රැස්වීම" යන්නෙහි අර්ථනිරූපණය ඉවත් කිරීමෙන්;

(උ) "විශේෂ යෝජනාව" සහ "කොටස්කරු" යන පාඨවල අර්ථනිරූපණ ඉවත් කිරීමෙන්; සහ

(ඌ) "භාණ්ඩාගාරයේ ලේකම්" යන්නෙහි අර්ථනිරූපණයට ඉක්බිති ව ම මෙහි පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"සැලකිය යුතු ප්‍රමාණයක සම්බන්ධතාවක්" යන්නෙන්—

(අ) එය සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගමේ කොටස්වලින් රුපියල් පන්ලක්ෂයක් හෝ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට පහක් යන මෙයින් අඩු ප්‍රමාණය ඉක්මවන ගෙවනු ලැබූ කොටස් ප්‍රමාණයක අර්ථදායී සම්බන්ධතාවක්, යම් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ කලත්‍රයා හෝ බාලවයස්කාර දරුවකු විසින් තනි තනි ව හෝ එක් ව

(ආ) එය ව්‍යාපාරික ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගමේ සියලු ම හවුල්කරුවන් විසින් ගෙවන ලද මුළු ප්‍රාග්ධනයෙන් සියයට පහකට වැඩි ප්‍රමාණයක අර්ථදායී සම්බන්ධතාවක් යම් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ කලත්‍රයා හෝ බාලවයස්කාර දරුවකු විසින් තනි තනි ව හෝ එක් ව හෝ දැරීම අදහස් වේ. ".

1961 අංක 65 දරන මුදල් පනතේ 8 වන වගන්තිය ඉවත් කිරීම.

**29.** (1) 1961 අංක 65 දරන මුදල් පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1961 අංක 65 දරන මුදල් පනතේ 8 වන වගන්තිය මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ඉවත් කරනු ලැබුව ද ඒ වගන්තිය යටතේ පත් කරන ලදුව මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ධුර දරන අධ්‍යක්ෂවරුන් ප්‍රධාන ප්‍රඥප්තියේ (මේ පනතින් ඇතුළත් කරන ලද ) 6 වන වගන්තිය යටතේ පත් කරන ලද්දාක් සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරු එකී 6 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ඔවුන්ගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි ව ඇති කාලසීමාව තුළ අධ්‍යක්ෂ ධුර දැරිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන හා දෙවන උපලේඛන මෙහි උපලේඛනයේ නිශ්චිත ව දැක්වෙන ආකාරයට හා ප්‍රමාණයට මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය ඇතුළත් කිරීම.

**31.** මෙහි පහත සඳහන් අලුත් උපලේඛනය ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට ඉක්බිති ව ම ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ "තුන්වන උපලේඛනය" වශයෙන් බලපවත්වනු ඇත :—

'තුන්වන උපලේඛනය (30 වන වගන්තිය)

"අ" ආකෘතිය

ඇතුම්කරු බැංකුව නොවන විට

විකුණුම් යන්ත්‍රිකයේ ආකෘතිය

*අවශ්‍ය තැන් වෙනස් කරන්න.

——— ගේ රුපියල් ——— ක මුදලක් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් ද මෙහි පහත සම්පූර්ණයෙන් විස්තර කර ඇති ——— යන දේපළ එකී ——— විසින් ——— දින අංක ——— දරන ඇපකරය මගින්, එකී *ඇපකරයේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඉගත කී මුදල ගෙවීමේ ඇපයක් වශයෙන්; *උකස් කර ඇති හෙයින් ද:

එකී *ඇපකරය මෙනුවෙන් අයවිය යුතු මුදල් එකී ——— විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ගෙවා නොමැති හෙයින් ද:

ඉහත කී දේපල ලංකා බැංකු ආඥාපනතට අනුකූල ව ——— වර්ෂයේ ——— මස ——— වන දින දී විකුණන ලදුව ඒ දේපල ——— හි පදිංචි ——— විසින් රුපියල් ——— ට මිලදී ගන්නා ලද අතර ඒ මුදල එකී ——— විසින් යථා පරිදි ගෙවා ඇති හෙයින් ද:

මෙහි පහත සඳහන් දේපල, එනම්, ——— (දේපල පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි විස්තරයක් මෙහි ඇතුළත් කරන්න) ——— එකී ——— ට රුපියල් ——— ට විකුණන ලද බවද එකී ——— විසින් රුපියල් ——— මුදලකට එකී දේපල මිලදී ගන්නා ලද බව ද ඔහු විසින් ඒ මුදල යථා පරිදි ගෙවන ලද බව ද ඒ දේපල මෙතැන් පටන් එකී ———, ඔහුගේ උරුමක්කාරයන්, පොල්මාකාරයන්, අද්මිනිස්ත්‍රාසිකාරයන් සහ ලැබුම්කාරයන් සතු වන බව ද සියලු දෙනාගේ ම දැනගැනීම සඳහා ඉහත කී ආඥාපනතින් හෝ එය යටතේ හෝ එම සම්බන්ධයෙන් ලංකා බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා එකී බැංකුව විසින් මෙයින් සහතික කරනු ලැබේ.

19 ——— ——— මස ——— දින වන අද දින ලංකා බැංකුවේ පොදු මුද්‍රාව යටතේ නිකුත් කරන ලදී.

මුද්‍රාව

මුද්‍රාව තැබීම තම අත්සනින් සහතික කරන ලංකා බැංකුවේ ——— ඉදිරිපිට දී මෙහි ඇක්වෙන ලංකා බැංකුවේ පොදු මුද්‍රාව මෙහි තබන ලදී.

(මෙය නොතාරිස් කෙනකු විසින් ලියා සහතික කොකළ යුතුය)

"ආ" ආකෘතිය (30 වන වගන්තිය)

**ඇනුම්කරු බැංකුව වන විට**

**විකුණුම් සහතිකයේ ආකෘතිය**

——— ගෙන් රුපියල් ——— ක මුදලක් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් ද මෙහි පහත සම්පූර්ණයෙන් විස්තර කර ඇති ——— යන දේපල එකී ——— විසින් ——— දින අංක ——— දරන * ඇපකරය මඟින්, එකී * ඇපකරයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඉහත කී මුදල ගෙවීමේ ඇපයක් වශයෙන් * උකස් කර ඇති හෙයින් ද: *අවශ්‍ය නැති වෙනස් කරන්න.

එකී ඇපකරය වෙනුවෙන් අය විය යුතු මුදල් එකී ——— විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ගෙවා නොමැති හෙයින් ද:

ඉහත කී දේපල ලංකා බැංකු ආඥාපනතට අනුකූල ව ——— වර්ෂයේ ——— මස ——— වන දින දී විකුණන ලදුව ඒ දේපල ලංකා බැංකුව සඳහා සහ එය වෙනුවෙන් ——— විසින් රුපියල් ——— ට මිලට ගන්නා ලද අතර, එකී මුදල, ඉහත සඳහන් පරිදි අය විය යුතු මුදලින් කොටසක් (හෝ අවස්ථාවෝචිත පරිදි මුළු මුදල ම) බේරුම් කිරීම් වශයෙන් යථා පරිදි බැංකුව වෙත බැර කර ඇති හෙයින් ද:

මෙහි පහත සඳහන් දේපල, එනම්, ——— (දේපල පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි විස්තරයක් මෙහි ඇතුළත් කරන්න) ——— විසින් එකී ලංකා බැංකුව සඳහා සහ එය වෙනුවෙන් රුපියල් ——— ට මිලට ගන්නා ලද බවත් එකී දේපල ඒත් මතු එකී ලංකා බැංකුව වෙත සම්පූර්ණයෙන් ම පැවරුණු බවත් ඉහත කී ආඥාපනතින් හෝ එය යටතේ හෝ ඊට සම්බන්ධයෙන් ලංකා බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා එකී බැංකුව විසින් සියලු දෙනාගේ ම දැනගැනීම සඳහා මෙයින් සහතික කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන
ලංකා බැංකු (සංශෝධන) පනත

19——— මස ——— දින වන මෙදින ලංකා බැංකුවේ පොදු මුද්‍රාව යටතේ නිකුත් කරන ලදී.

මුද්‍රාව

මුද්‍රාව තැබීම තම අත්සනින් සහතික කරන ලංකා බැංකුවේ ——— ඉදිරිපිට දී මෙහි දැක්වෙන ලංකා බැංකුවේ පොදු මුද්‍රාව මෙහි තබන ලදී.

සාක්ෂිකරුවන් :

(නොතාරිස් කෙනකු විසින් සහතික නොකළ යුතුය)".

උපලේඛනය

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

1. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයෙහි I වන කොටසෙහි 1 වන වගන්තියෙහි—

(අ) (ඊ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) ලංකාණ්ඩුව විසින් හෝ වෙනත් යම් රටක ආණ්ඩුව විසින් හෝ යම් සමාගමක් හෝ සංස්ථාවක් විසින් නිකුත් කරනු ලැබූ නැතහොත් සහතික කරනු ලැබූ ස්කන්ධ, කොටස්, ණයකර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම්පත් මිලට ගැනීම, විකිණීම, ආයෝජනය කිරීම, ප්‍රතිරක්ෂණය කිරීම, ගණුදෙනු කිරීම සහ බැහැර කිරීම:

එසේ වුව ද එකී යම් වෙනත් රටක් විසින් හෝ එකී යම් සමාගමක් හෝ සංස්ථාවක් විසින් නිකුත් කරන ලද නැතහොත් සහතික කරන ලද ස්කන්ධ, කොටස්, ණයකර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම්පත් සහ මේවාට අදාළ වන යම් ගණුදෙනුවක්, බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ ලිඛිත නිර්දේශය සලකා බැලීමෙන් පසු බැංකුවේ අධ්‍යක්ෂවරුන් හතරදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් දිය යුතු අනුමතිය හා අමාත්‍යවරයාගේ ලිඛිත එකඟත්වය ද ඇති ව මිස, බැංකුව විසින් නො කළ යුතුය.";

(ආ) (උ) ඡේදයේ අවසාන විධානය වෙනුවට පහත සඳහන් අලුත් අවසාන විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද මේ ඡේදයෙහි ඇතුළත් බලය ක්‍රියාත්මක කළ යුත්තේ බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ ලිඛිත නිර්දේශය සලකා බැලීමෙන් පසු බැංකුවේ අධ්‍යක්ෂවරුන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් දිය යුතු අනුමතිය හා අමාත්‍යවරයාගේ ලිඛිත එකඟත්වය ද ඇති ව පමණකි.";

(ඇ) (ඌ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

දේපල අත්කර ගැනීම.

(ඌ) යම් නිශ්චල හෝ චංචල දේපලක් සහ යම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිලට ගැනීම, බදුගැනීම හෝ හුවමාරු කර ගැනීම

(ආ) (ඡ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"ලාභ බෙදාගැනීම සඳහා වූ වැඩපිළිවෙළකට ඇතුළත් වීම. (ඡ) යම් ව්‍යාපාරයක් හෝ ගනුදෙනුවක් කරගෙන යන හෝ එවැනි කක නියුක්තව සිටින හෝ එවැනි කක් කරගෙන යෑමට හැකියාවක් ඇති හෝ නියුක්තවීමට ආසන්නව සිටින යම් තැනැත්තකු හෝ සමාගමක් සමඟ ලාභ බෙදා ගැනීම, අර්ථලාභ ඒකාබද්ධ කර ගැනීම, සහයෝගයෙන් කටයුතු කිරීම, බද්ධ ව්‍යාපාර සහ අන්‍යොන්‍ය අනුග්‍රහ සඳහා වූ හෝ අන් ලෙසක වූ යම් වැඩ පිළිවෙළකට ඇතුළත් වීම." ;

(ඉ) (ජ) ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත සඳහන් අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද මේ ඡේදයෙහි ඇතුළත් බලය ක්‍රියාත්මක කළ යුත්තේ බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ ලිඛිත නිර්දේශය සලකා බැලීමෙන් පසු බැංකුවේ අධ්‍යක්ෂවරුන් හතරදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් දිය යුතු අනුමතිය හා අමාත්‍යවරයාගේ ලිඛිත එකඟත්වය ද ඇති ව පමණකි." ;

(ඊ) (ඣ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"බැංකුවේ දේපල සම්බන්ධයෙන් ක්‍රියා කිරීම. (ඣ) බැංකුවේ අතේ හෝ බැංකුව විසින් බදු ගන්නා ලද හෝ සතුව සිටින හෝ භුක්ති විඳින යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම හෝ එම ඉඩම දියුණු කිරීම සහ, බැංකුවේ දේපල සහ අයිතිවාසිකම් සියල්ලම හෝ ඉන් යම් කොටසක් පාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, බදු දීම, උකස් කිරීම, බැහැර කිරීම, විකිණීම, ලාභ ඉපයීම සඳහා යෙදීම හෝ අන් ලෙසකින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම." ;

(උ) (ඤ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"බැංකුව පිළිගනු ලැබීමට කටයුතු සැලැස්වීම. (ඤ) යම් විදේශීය රටක හෝ ස්ථානයක බැංකුව ලියාපදිංචි කිරීමට හෝ පිළිගනු ලැබීමට සැලැස්වීම." ;

(ඌ) (ට) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"අනුග්‍රහ ලබාගැනීම. (ට) යම් අයිතිවාසිකම්, අනුග්‍රහ සහ වරප්‍රසාද ලබාගැනීම සඳහා යම් ආණ්ඩුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමඟ වැඩ පිළිවෙළකට ඇතුළත් වීම." ;

(එ) (ඩ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"කුලී සින්නාක්කර ව්‍යාපාර කටයුතු කිරීම. (ඩ) කුලී සින්නාක්කර ව්‍යාපාර කටයුතුවල යෙදීම සහ වට්ටම්, කොමිස් සහ වෙනත් පාරිශ්‍රමික ලබා ගැනීම." ;

(ඒ) (ණ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"සමාගම් පිහිටුවීම. (ණ) යම් ව්‍යාපාරයක් කරගෙන යාම, යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් සමාගමක ව්‍යාපාරය අත්කරගැනීම සහ භාරගැනීම, එහි යම් සම්බන්ධතාවක් මිලට ගැනීම හෝ එහි යම් කොටස් හෝ ...

(ඔ) (ණ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද අන්තර්ගත කිරීමෙන් :—

"යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් භෙදීය හැකියයි බැංකුවට පෙනෙන අන්දමේ වෙනත් යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙනයාම් හෝ වෙනත් යම් කටයුත්තක යෙදීම ;

(ප) ප්‍රයෝජනවත් ආකාරයකින් කරගෙන යා හැකියයි භෙදීය හැකියයි බැංකුවට පෙනෙන අන්දමේ වෙනත් යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙනයාම් හෝ වෙනත් යම් කටයුත්තක යෙදීම ;

සංශෝධනය කරුණු.

(ඵ) ඉහත සඳහන් අරමුණු ඉටුකරගැනීමට හෝ ඉහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ සියලු දේ කිරීම.".

(2) එම උපලේඛනයේ II වන කොටසේ 3 වන වගන්තියෙහි—

(අ) (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"ණය, අයිරා අණකර, අත්තිකාරම් සහ වෙනත් අනුග්‍රහ මුදල් ඇතැම් තත්වයන් යටතේ මිසින් පමණක් ප්‍රදානය කළ යුතු බව.

(අ) බැංකුව විසින් යම් තැනැත්තකුට ප්‍රදානය කරනු ලබන කිසිම ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් එය ලබන තැනැත්තා ඒ අත්තිකාරමේ, ණය මුදලේ හෝ වෙනත් අනුග්‍රහ මුදලේ ප්‍රමාණය දක්වා මුදලක් ණය වශයෙන් ලැබීමට සුදුස්සකු බවට හෝ ඒ මුදල ප්‍රමාණවත් ඇප සත්වයන් යටතේ මිසින් සුරක්ෂිත කරනු ලැබ ඇති බවට හෝ ඒ මුදල යොදවනු ලබන ව්‍යාපාරය හෝ යෝජනා ක්‍රමය මුදල් අනින් සුරක්ෂිත එකක් බවට මණ්ඩලය සැහීමට පත් වුවහොත් මිස, ප්‍රදානය කරනු නොලැබිය යුතුය :

එසේ වුව ද මේ ඡේදයේ ඉහත වූ විධිවිධානවල නියමය ප්‍රකාර මණ්ඩලය සෑහීමට පත් කළ නොහැකි යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට, සමුපකාර සමිතියකට, අනුමත සමිතියකට හෝ නීතිගත නොකරනු ලැබූ පුද්ගල මණ්ඩලයකට යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක්, ප්‍රදානය කිරීම මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇතොත් සහ ඒ අත්තිකාරම, ණය හෝ වෙනත් අනුග්‍රහ මුදල ආපසු ගෙවීම මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් 10 වන වගන්තිය යටතේ සහතික කර ඇතොත් එම ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල බැංකුව විසින් ප්‍රදානය කළ හැකිය ;

(ආ) (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"අධ්‍යක්ෂවරුන්ට සහ සමාගම්වලට ණය දීම.

(ආ) (i) යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් වීමට පෙර ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ සැලෙන ප්‍රමාණයක සම්බන්ධතාවක් ඇති යම් සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් වශයෙන් කිසි ම මුදලක් ප්‍රදානය කරනු ලැබ නොමැති වූ අවස්ථාවක ඒ සමාගමට හෝ ව්‍යාපාර ආයතනයට කිසි ම ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් ප්‍රදානය කරනු නොලැබිය යුතු නමුත් මුළු එකතුව රුපියල් පණස් දහසකට නොවැඩි මුදලක් ණය, අයිරා අණකර, අත්තිකාරම් සහ වෙනත් අනුග්‍රහ මුදල් වශයෙන් ඒ අධ්‍යක්ෂවරයාට ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(ii) අධ්‍යක්ෂවරයකු වශයෙන් තම පත්වීම ලැබීමට පෙර ඒ අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ සැලෙන ප්‍රමාණයක සම්බන්ධතාවක් ඇති යම් සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් වශයෙන් යම් මුදලක් ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පත්වීම

ලැබීමට පෙර ඒ අධ්‍යක්ෂවරයාට, සමාගමට හෝ ව්‍යාපාරි ආයතනයට ප්‍රදානය කරන ලද මුදල් වල මුළු එකතුව නොඉක්මවන මුදලක්, ආපසු නොගෙවා ඉතිරි ව ඇති යම් මුදලක් තිබේ නම් එය එයින් අඩු කර ගෙන, ණය, අයිරා අණකර, අත්තිකාරම් හෝ වෙනත් අනුග්‍රහ මුදල් වශයෙන් ඒ අධ්‍යක්ෂවරයාට, සමාගමට හෝ ව්‍යාපාර ආයතනයට ප්‍රදානය කරනු ලැබිය හැකිය:

එසේ වුව ද අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් වීම ලැබීමට පෙර අධ්‍යක්ෂවරයකුට එසේ ප්‍රදානය කරන ලද මුදල රුපියල් පණස් දහසකට නොවැඩි මුදලක් වන අවස්ථාවක, ආපසු නොගෙවා ඉතිරි ව ඇති යම් මුදලකට අතිරේක ව රුපියල් පණස් දහස නොඉක්මවන මුදලක් ණය, අත්තිකාරම්, අයිරා අණකර හෝ වෙනත් අනුග්‍රහ මුදල් වශයෙන් ඒ අධ්‍යක්ෂවරයාට ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(iii) තත් කාලයේ බැංකුවේ අධ්‍යක්ෂවරයකුට හෝ ඔහුගේ පවුලේ ප්‍රමාණයක සම්බන්ධතාවක් ඇති ව්‍යාපාර ආයතනයකට හෝ සමාගමකට, කිසි ම ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක්, බැංකුව විසින් අනුමත කරන ලද ඇප තබනු ලැබ ඇත් නම් මිස සහ ණය, අයිරා අණකර, අත්තිකාරම් හෝ වෙනත් අනුග්‍රහ මුදල දීමට මණ්ඩලයේ රැස්වීමක දී තවත් අධ්‍යක්ෂවරුන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කැමැත්ත පළ කරනු ලැබ ඇතොත් මිස ප්‍රදානය කරනු නොලැබිය යුතුය.".

(ඇ) (ඊ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"සේවකයන් විසින් ඇපවීම. (ඊ) බැංකුවේ සේවකයකුගේ ඇපවීම පිට කිසිම ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක්, බැංකුවේ ම තවත් සේවකයකුට හැර වෙනත් තැනැත්තකුට ප්‍රදානය කරනු නොලැබිය යුතුය.";

(ඈ) (උ) ඡේදය අත් හැරීමෙන්.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) එහි I, II, III, IV සහ V වන කොටස් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි VI වන කොටස I වන කොටස ලෙස නැවත අංක කිරීමෙන් ;

(ඇ) 70 වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් ;

(ඈ) 60, 61, 62, 63, 64, 65, 66, 67, 68, 69 සහ 71 යන අතුරු ව්‍යවස්ථා පිළිවෙලින් 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 සහ 11 යන අතුරු ව්‍යවස්ථා ලෙස නැවත අංක කිරීමෙන් ;

(ඉ) නැවත අංක කරන ලද 6 වන අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ (ඇ) අනුඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) මණ්ඩලයේ සහ කමිටුවල සියලු ම රැස්වීම්වල කටයුතු සහ සම්මත යෝජනා.";

(ඊ) නැවත අංක කරන ලද 10 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"9 වැනි අතුරු ව්‍යවස්ථාවට ව්‍යතිරේක. 10. අධ්‍යක්ෂවරුන්ට හෝ ඔවුන් ගෙන් කිසිවකුට අත්තිකාරම් මුදල් සඳහා යම් ඇපයක් සැපයීම හෝ හානි රක්ෂණය සඳහා යම් ඇපයක් සැපයීම පිණිස බැංකුව විසින් හෝ බැංකුවේ

(ඩ) නැවත අංක කරන ලද 11 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ඇතුළු කිරීමෙන් :—

"මණ්ඩලයේ කටයුතු පවරාදීම.

11. (1) සාමාන්‍යාධිකාරී පත් කිරීමේ බලය හැර මණ්ඩලයේ තමර හෝ බලයක් අධ්‍යක්ෂවරුන් දෙදෙනකුගෙන් නොඅඩු සංඛ්‍යාවකින් සංයුක්ත වන කමිටුවකට හෝ අධ්‍යක්ෂවර යකුට හෝ සාමාන්‍යාධිකාරීට හෝ මණ්ඩලය විසින් තෝරා ගනු ලබන බැංකුවේ වෙනත් යම් නිලධරයකුට හෝ පවරා දිය හැකිය ; තවද එසේ වූ යම් බලය පවරා දීමක්, සම්පූර්ණයෙන් ම හෝ කොටස් වශයෙන් හෝ ඇතැම් කාලවකවානුවලට හෝ ඇතැම් කාර්යයන්ට අදාළ වන පරිදි කලින් කල ප්‍රත්‍යාදිෂ්ට කළ හැකිය. ඒ සෑම කමිටුවක් ම, අධ්‍යක්ෂවරයෙක් ම, සාමාන්‍යාධිකාරීවරයෙක් ම හෝ වෙනත් සෑම නිලධරයෙක් ම තමන් වෙත පැවරුනු බලතල ක්‍රියාත්මක කිරීමේදී මණ්ඩලය විසින් සාදනු ලබන සියලු ම නියෝගවලට අනුකූල ව ක්‍රියා කළ යුතුය.

(2) (1) වන ඡේදය යටතේ තමා වෙත පවරන ලද බලතලවලින් තමර හෝ බලයක් තමා විසින් තෝරාගනු ලබන බැංකුවේ යම් නිලධරයකුට ලියවිල්ලකින් පැවරීම සාමාන්‍යාධිකාරී විසින් මණ්ඩලයේ එකඟත්වය ඇති ව කළ හැකිය. ඒ සෑම නිලධරයෙක් ම තමාට මේ ඡේදය යටතේ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී, මණ්ඩලය විසින් හෝ සාමාන්‍යාධිකාරී විසින් සාදනු ලබන නියෝගවලට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(3) එවැනි යම් කමිටුවක්, අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී හෝ වෙනත් යම් නිලධරයකු විසින් අන්‍යාකාරයකින් නොව එවැනි නියෝගවලට අනුකූලව හා තම පත්වීමේ කාර්යයන් සපුරාලීම සඳහා කරන ලද සියලු ම ක්‍රියා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද්දාක් පරිද්දෙන් බලසහිත සහ වලංගු වන්නේ ය." ;

(ඪ) එහි VII වන කොටස II වන කොටස ලෙස නැවත අංක කිරීමෙන් ;

(ණ) 72 වන අතුරු ව්‍යවස්ථාව 12 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ත) නැවත අංක කරන ලද 12 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ඇතුළු කිරීමෙන් :—

"ණයවර සහ ණය.

12. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ ලිඛිත නිර්දේශය සලකා බලා තත් කාලයේ බැංකුවේ සියලු ම අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරනු ලැබ ඇත් නම් මිස, සාමාන්‍යාධිකාරීගේ නිර්දේශය නොමැති ව මණ්ඩලය විසින් ඒ කිසි ම ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් අනුමත කරනු නොලැබිය යුතුය." ;

(ථ) 73 වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් ;

(ද) 74 වන අතුරු ව්‍යවස්ථාව 13 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ධ) එහි VIII වන කොටස III වන කොටස ලෙස නැවත අංක කිරීමෙන් ;

(න) 75 වන අතුරු ව්‍යවස්ථාව 14 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ච) නැවත අංක කරන ලද 14 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික.

14. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හා එසේ නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව වූ පාරිශ්‍රමික, බැංකුවේ අරමුදල් වලින් අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලැබිය හැකිය.";

(ජ) 76 වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් ;

(ට) 77 වන සහ 78 වන අතුරු ව්‍යවස්ථා 15 වන සහ 16 වන අතුරු ව්‍යවස්ථා ලෙස නැවත අංක කිරීමෙන් ;

(ඩ) 79 වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් ;

(ණ) 80 වන අතුරු ව්‍යවස්ථාව 17 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ත) නැවත අංක කරන ලද 17 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"විශේෂ සේවා සඳහා අධ්‍යක්ෂවරුන්ට පාරිශ්‍රමික ගෙවීම.

17. යම් අධ්‍යක්ෂවරයකුට යම් විශේෂ රාජකාරියක් හෝ කටයුත්තක් පැවරී ඇති විටක හෝ ඉල්ලීමක් උඩ බැංකුව වෙනුවෙන් විශේෂ සේවයක් ඔහු විසින් කරනු ලබන විටක සුදුසු යයි බැංකුවට හැඟෙන ප්‍රමාණයක අතිරේක පාරිශ්‍රමික ඔහුට ප්‍රදානය කළ හැකිය. මණ්ඩලයේ හෝ මණ්ඩලයේ කමිටුවල හෝ රැස්වීම්වලට පැමිණීමේදී හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවලදී හෝ ඒ කටයුතු සම්බන්ධයෙන් වෙනත් ආකාරයකින් ඔවුන් විසින් දරන සියලු ම සාධාරණ ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ අනිකුත් වියදම් බැංකුව විසින් ඔවුන්ට ආපසු ගෙවිය හැකිය.".

(ද) 81 වන අතුරු ව්‍යවස්ථාව 18 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(න) නැවත අංක කරන ලද 18 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"අධ්‍යක්ෂවරුන් වන රාජ්‍ය නිලධරයන්ගේ පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු බව.

18. රාජ්‍ය නිලධරයන් වන අධ්‍යක්ෂවරුන්ට හිමිවන සියලු ම පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.";

(ප) එහි IX වන කොටස V වන කොටස ලෙස නැවත අංක කිරීමෙන් ;

(බ) 82 වන, 83 වන සහ 84 වන අතුරු ව්‍යවස්ථා ඉවත් කිරීමෙන් ;

(ම) 85 වන අතුරු ව්‍යවස්ථාව 19 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ය) නැවත අංක කරන ලද 19 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"අර්ධ වාර්ෂික ලාභාංශ.

19. (i) අර්ධ වාර්ෂික ලාභාංශ ගෙවීම සාධාරණ වන ප්‍රමාණයක ලාභ යම් අර්ධ වර්ෂයක් තුළ දී බැංකුව විසින් උපයා ඇති බවට සාමාන්‍යාධිකාරී විසින් කරන වාර්තාවක් අනුව ද ; සහ

(ii) අමාත්‍යවරයාගේ අනුමතිය ඇති ව අර්ධ වාර්ෂික ලාභාංශ ප්‍රකාශ කිරීම

(අඅ) 86 වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් ;

(ආආ) 87 වන අතුරු ව්‍යවස්ථාව 20 වන අතුරු ව්‍යවස්ථාව ලෙස නැවත අංක කිරීමෙන් ;

(ඇඇ) නැවත අංක කරන ලද 20 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"සංචිත අරමුදල ආයෝජනය කිරීම.

20. කිසියම් සංචිත අරමුදල්වල බැරට තිබෙන මුදල් ප්‍රමාණ සහ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල කාර්යයන් සඳහා තත් කාලයේ දී යොදවා නැති හෝ අවශ්‍ය නොවන වෙනත් යම් අරමුදල් ද—

(අ) සාමාන්‍යාධිකාරී විසින් ලියවිල්ලකින් නිර්දේශ කරන ලද සහ මණ්ඩලයේ රැස්වීමකදී අධ්‍යක්ෂවරුන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවකගේ වැඩි ඡන්දයෙන් අනුමත කරන ලද්දා වූ; හෝ

(ආ) බැංකුවේ සාමාන්‍යාධිකාරියගේ ලිඛිත නිර්දේශය සලකා බලා තත් කාලයේ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සියලු දෙනා විසින් ම ඒකමතික ව අනුමත කරන ලද්දා වූ

ස්කන්ධවල, කොටස්වල, ණයකරවල, බැඳුම්කරවල හෝ සුරැකුම්පත්වල, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතුව ආයෝජනය කරනු ලැබිය යුතුය." ;

(ඈඈ) 88 වන, 89 වන සහ 90 වන අතුරු ව්‍යවස්ථා ඉවත් කිරීමෙන් ; සහ

(ඉඉ) එහි X වන කොටස ඉවත් කිරීමෙන්.'.